# 14. බලවත් ඇදහිල්ලක්

ඇදහිල්ල හා ප්‍රේමය යහපත් කිතුනුවකු විසින් සිය ජීවිත තුළ ඇති කර ගත යුතු වැදගත් ගුණාංග දෙකක් බව අපි හඳුනා ගතිමු. ඒ අතුරින් කිතුනු ප්‍රේමය කෙබඳු විය යුතු ද යන්න අපි පසුගිය පාඩමෙන් උගතිමු. මෙම පාඩමෙන් අප උත්සාහ කරනු ලබන්නේ කිතුනු අප තුළ පවත්වා ගත යුතු ඇදහිල්ල සවිමත් කර ගැනීමට අදාළ අත්දැකීමක් ලැබීමට ය.

**කියවා බලමු**

**ශු. මාක් 10:46-52**



අම්මායි මමයි සුපුරුදු පරිදි අදත් ගෙදරින් පිට වුණේ ආච්චියි සීයයි බලන්න යන්න. ඔවුන් අප එනතුරු බලා ඉන්නේ හරිම ආසාවෙන්. ඒත් වෙනදා වගේ නොවෙයි අද පාර හරිම කලබල යි. පාර දෙපැත්තේ සෙනග පිරිලා. ඔවුන් කාවදෝ අමුත්තෙක් බලාපොරොත්තුවෙන් සිටින බව යි මට හැඟෙන්නේ.

"අම්මේ මේ කලබලය මොකක් ද කියා අපි ටිකක් නැවතිලා බලමු." මම අම්මාට කීවා. තැන් තැන්වල සෙනග පිරිලා. අපට නැවතී සිටීමට පවා ඉතා අපහසුයි. ඒත් අපි පාරේ අයිනකට වෙලා මේ සිදුවන්නේ කුමක් දැ යි බලා සිටියා 'පුතා මේ සෙනග මග දෙපස නැවතිලා බලාගෙන ඉන්නේ ජේසුස් වහන්සේ එනතුරු'. අන්න උන්වහන්සේ ශ්‍රාවකයන් එක්ක මේ පැත්තට එනවා . අම්මා කීවා ය. මා ඉතා ආසාවෙන් ඒ දෙස බලා සිටියේ. මගේ හිතට දැනෙන්නේ පුදුම සතුටක්. එය වචනවලින් විස්තර කරන්නට බැහැ. ජේසුස් වහන්සේ ගැන, උන්වහන්සේ කරන පුදුම ක්‍රියා පිළිබඳ ව මා අසා තිබුණා පමණ යි, කවදාවත් උන්වහන්සේ කවුද? මොනවගේ කෙනෙක් ද? කියා දැක තිබුණේ නැහැ. ඒත්! අද පුදුම අවස්ථාවක් ! උන්වහන්සේ එන මගට උන්වහන්සේ ව පිළිගැනීමට වගේ සෙනග දුවගෙන යනවා, අන්ධ සීයා කෙනෙක් පාරේ වාඩි වෙලා හැම දෙනාගේ ම උදව් ඉල්ලනවා..

මේ අන්ධ සීයාගේ නම බාර්තිමෙයස් කියා අම්මා දවසක් කීවා. ආච්චි කීවා මොහු තිමේයස් කියා කෙනෙකුගේ පුතෙක්ලු. කොහොම වුණත් මේ අන්ධ සීයා ඉතා අසරණ දුප්පත් කෙනෙක් බවයි පෙනෙන්නේ.

"අන්න නාසරෙත් හි ජේසුස් වහන්සේ වඩිනවා" කියා ජේසුස් වහන්සේ එන මග බලා සිටි කවුදෝ කෙනෙක් සීයාට කීවා. සීයා එකපාරටම කලබල වුණා ."දාවිත්ගේ පුත් ජේසුස් වහන්ස මට අනුකම්පා කරන්න " කියා සීයා මහ හඬින් කෑගසනවා. "කරුණාකරලා ඔය ශබ්දය නවත්වන්න" නිහඬ වෙන්න, කීප දෙනෙක් ම සීයාට තරවටු කළා. ඒත් අන්ධ බාර්තිමෙයස් සීයා ඒවායින් නතර වෙන්නේ නැහැ. " දාවිත්ගේ පුත්‍රයාණෙනි මට අනුකම්පා කළ මැනව, මා ගැන බැලුව මැනව' කියා සීයා වැඩි වැඩියෙන් මොර දෙනවා.

"පුතා අන්න ජේසුස් වහන්සේ කුමක්දෝ කියනවා" අම්මා කීවා. "පුතා අපි තව ටිකක් එතැනට ළං වෙමු" අම්මා එසේ කියා මාවත් අල්ලාගෙන එතැනට ම කොහොම හරි ළංවුණා. දැන් හොඳට පේනවා සිදුවෙන දේවල්. 'ඔහුට හඬ ගසන්න' ජේසුස් වහන්සේ එතැන ඉන්න මාමා කෙනෙකුට කීවා. "අන්න සීයාට ජේසුස් වහන්සේ කතා කරනවා ධෛර්යය අරන් යන්න", ඒ මාමා එසේ කියමින් සීයාට ඉදිරියට යන්න ඉඩ දුන්නා. " අර බලන්න අම්මේ සීයා සළුව ගසා දමා පැන ගෙන දුවන හැටි" 'ඔව් පුතා අර බලන්න සීයාගේ මුහුණේ තියෙන සතුට, ඇස් නොපෙනුනාට පුදුම හැඟීමක් භක්තියක් ඒ මුහුණේ තියෙන්නේ." අම්මා කීවා.

"මා ඔබට කුමක් කර දෙනවාට ඔබ කැමති ද?" ජේසුස් වහන්සේ සීයාගෙන් අහනවා. "අනේ ගුරු දේවයිණී මට පෙනීම ලබා දෙන්න. " සීයා උත්තර දෙනවා " ඔබේ ඇදහිල්ල ඔබට සුවය ලබා දී තියෙනවා" කියා ජේසුස් වහන්සේ කීවා විතරයි සීයාට පෙනීම ලැබුණා. උන්වහන්සේගේ බලය හරි පුදුමයි." අම්මේ, මේ නම් පුදුම හාස්කමක්, අන්න සීයාගේ ඇස් ඇරුණා . අර! අර! බලන්න සීයාගේ සතුට.

පුතා, බාර්තිමෙයස් සීයා අද තමාගේ අන්ධ සිඟමන් ජීවිතයට සමු දෙයි. "අන්න! අන්න! කියන කොටම සීයා ජේසුස් වහන්සේ පස්සේ ගමන් කරනවා." හැමෝම පුදුමයට පත්වෙලා බලා සිටිනවා. "ඇත්තටම මෙය නම් සිහිනයක් සැබෑ වුණා වගෙයි, ඔව් ඇදහිල්ල නිසා සිහිනයක් සැබෑ වෙලා". "හරියටම හරි අම්මේ මේ නම් ඇදහිල්ලේ හාස්කමක්." මට හයියෙන් කෑ ගැසුණා "ඔව් පුතේ ඇදහිල්ල ඇත්නම් බොහෝ පුදුම දේවල් අත් දකින්න පුළුවන්." එසේ කියමින් අම්මා මගේ හිස අත ගෑවා.

## අන්ධ බාර්තිමෙයස් ඇදහිල්ලෙන් පෙනීම ලැබී ය.
## කිතුනුවන් තුළ තිබිය යුතු මේ ඇදහිල්ල  යනු කුමක් ද?

*ඇදහිල්ල වනාහි*
*බලාපොරොත්තු වන දේ පිළිබඳ සහතිකය වේ.*
*නොපෙනෙන දේ පිළිබඳ පැහැදීම ය.*
*හෙබ්‍රෙව් 11:1*

දෙවියන් වහන්සේට
සියල්ල කළ හැකි බව
විශ්වාස කරන්න....
එය ඇදහිල්ලයි

**තවදුරටත් ඇදහිල්ල පිළිබඳ ව දේව වචනය තුළින් සොයා බලා සටහන් කර ගන්න.**

| | | |
|---|---|---|
| ජාකොබ් 2:17 | ගලාති 3:26 | ශු. ලූක් 9:23 |
| ශු. මතෙව් 17: 20 | 1 තිමෝති 6:12 | ගලාති 2:16 |

### කිතුනු අපගේ දිනපතා ජීවිතයට .............

- ★ ඇදහිල්ලෙහි ස්ථිර ව සිටිමු
- ★ ඇදහිල්ලෙන් ජේසුස් වහන්සේ වෙතට ළංවෙමු
- ★ ඇදහිල්ලෙන් ප්‍රාතිහාර්ය අත්දකිමු
- ★ ඇදහිල්ලේ බලය තුළ ජීවිත ජය ගනිමු.



නමදිමු හිමිතුම ඇදහිල්ලෙන්
පසසමු සමිඳුන් ඇදහිල්ලෙන්
යදිනෙමු දෙවිඳුන් ඇදහිල්ලෙන්
හිමි පසුපස යමු ඇදහිල්ලෙන්

පීඩා දුක් මැද ඇදහිල්ලෙන්
ලෙඩ දුක් ඇති විට ඇදහිල්ලෙන්
බාධක බිය මැද ඇදහිල්ලෙන්
දෙවිඳුන් වෙත යමු ඇදහිල්ලෙන්

සුව ලබනෙමු නිති ඇදහිල්ලෙන්
ජය අත් විඳිනෙමු ඇදහිල්ලෙන්
සවි දිරි ලබනෙමු ඇදහිල්ලෙන්
සමිඳුන් තුළ නිති ඇදහිල්ලෙන්

දෙව් දරුවන් ලෙස ඇදහිල්ලෙන්
දිවි ගෙවනෙමු අපි ඇදහිල්ලෙන්
කිතුහිමි තුළ නිති ඇදහිල්ලෙන්
ඉදිරියටම යමු ඇදහිල්ලෙන්

**කටපාඩම් කරමු.**
**හෙබ්‍රෙව් 11:1**

ක්‍රියාකාරකම

(01) ශුභාරංචි පොත්වල සඳහන් පරිදි ඇදහිල්ල තුළින් සුවය ලැබූ අයගේ ලැයිස්තුවක් පිළියෙල කරන්න.